


## 12 වන කොටස

සල්මල් මාවත දෙපස වසා ගත් මැයි මල් ගස් නහවමින් සිරිපොද වැසි බින්දු වැටෙන හැටි කාමරයේ ජනේල වීදුරුව තුළින් විශ්වජිත් දුටුවේ ය. මේ වැස්ස පටන් ගෙන තිබුණේ ඔහු කාමරයට එන්නටත් පෙරදී ය. වැස්සෙන් තෙමුණ තාර පාරේ ඇදෙන වාහන වල රෝද වලින් නැගෙන චිරි චිරි ය මේ අතුරු පාරටත් ඇසෙයි.

විදුලි පහන් එළියෙන් දිදුලන ඒ වැහි බින්දු දෙස අනිමිසලෝවයෙන් බලා සිටි විශ්ව ගේ සිත රැඳී තිබුණේ අමන්දි වෙත ය. ජීවිතයේ මෙතරම් සසළව ගෙවී ගිය කාලයක් ඔහුට මතක නැත. හරියාකාරව තේරුම් ගත නොහැකි යම්කිසි බැඳීමක් හෝ වනයම් ආකර්ශණයක් විසින් තමා ඈ වෙත ළං කරවනු ලැබෙමින් ඇතැයි ඔහුට දැනෙයි. එය අනුකම්පාවක් විය හැකිදැයි ඔහු සිතයි.

ඊයේ නිමන්ත විශ්වජිත් හමුවන්නට ආ වේලේ සිට මේ කැළඹීම තවත් වැඩි ඇත. විශ්වජිත් ෂැංහයි අවන්හලේ දී නිමන්ත හමුවූයේ තමා කෙසේ හෝ හමුවන්නෙැයි ඔහු ඉල්ලා සිටි බැවිනි. නිමන්තට අවශ්‍යව තිබුණේ නිස්කලංකව විශ්වජිත් හා කතා කරන්නට ය. අලුතින් නිමහම් කළ බේරේ වැවේ සුන්දර දිය තලාවට මායිම්ව පිහිටි මේ අවන්හලේ හිමිකරු විශ්වජිත් ගේ මිතුරෙකි. එනිසාම මේ සුන්දර අවන්හලේ අභ්‍යන්තරය පවා නිම කෙරුණේ විශ්වජිත් ගේ මග පෙන්වීම යටතේ ය.

නිමන්ත ගේ මුහුණ පුරා ඇඳුණ පරාජිත පෙනුම විශ්වජිත් හඳුනාගත්තේ ය. කුමන පැත්තෙන් බැලුවද නිමන්ත පරාජය වෙමින් තිබෙන බව විශ්වජිත් තේරුම් ගනිමින් සිටියේ ය.

කතාව කොතැනින් ආරම්භ කළ යුතුදැයි සිතා ගත නොහැකිව දෙදෙනාම විනාඩි කීපයක් නිහඬව බලා සිටිය හ.

"අමන්දි හොඳට අඳිනවා.." අවසන විශ්වජිත් කීවේ කොතැනින් හෝ කතාව ආරම්භ කළ යුතු නිසා ය. "..මුළ ඉඳලම එයාගෙ නිර්මාණ වල ආධුනික ගතියක් මට පෙනුනෙ නැහැ.. පුදුමයි.. මම එහෙම දෙයක් බලාපොරොත්තු වුණේ ම නැහැ.."

නිමන්ත මළානික සිනාවක් පෑවේ ය. එය හදවතින් උපන්නක් සිනාවක් නොවේ යයි විශ්ව සිතුවේ ය.

"එයා පොඩි කාලෙ ඉඳන්ම ඇන්දා.. ඒ කාලෙත් දක්ෂයි.. තෑගිත් දිනලා තියෙනවා.. මාව බැන්දට පස්සෙ ඒ ඔක්කොම නැවතුණා.. හිතේ ආසාව තියෙන්න ඇති.." නිමන්ත මොහොතකට කතාව නවතා බිම බලාගත්තේ ය. ඒ කඳුළින් පිරුණ සිය දෑස තමාගෙන් සඟවාගන්නට බව විශ්වජිත් වටහා ගත්තේ ය. ".. ඒත්.. ඒත් මේ අන්තිම පැය වෙනකල් එයාගෙ හිතේ හංගගෙන හිටිය ඒ ආසාවට ඉඩක් හොයල දෙන්න මට බැරි වුණා.."
විශ්වජිත් නිහඬව අසා සිටියේ ය. අදහස් දක්වනවාට වඩා අසා සිටිම මේ මොහොතේ කළ හැකි පහසුම දෙය යි.

".. එයා අන්තිම මොහොතෙ හරි තමන් කැමති දේකට යොමුවුණ එක ගැන මට සතුටුයි.. මට එයා නැති වුණාත්.." නිමන්ත කතාව මොහොතකට නවතා බලා සිටියේ ය.

"බලාපොරොත්තු නැති කරගන්න එපා.." විශ්වජිත් කීවේ ය.

"මගේ හිතේ කිසිම දෙයක් ගැන කිසිම බලාපොරොත්තුවක් නැහැ විශ්ව.. මොන පැත්තෙන් ගත්තත් අමන්දි මට නැතිවෙනවා කියන එක මං දැන් තේරුම් ගනිමින් ඉන්නෙ..



දෛවයේ මොනයම් හෝ වාසනාවකින් එයා සනීප වුණාත් එයා ආයෙත් මගේ ලෝකෙට එන්නෙ නැහැ කියන එක මට දැනෙනවා.. ඒ තරමටම එයා දැන් මගෙන් ඈත් වෙලා... ආයෙම ගොඩ නගන්න බැරි තරමට අපේ සම්බන්ධතාව දුරස් වෙලා කියන එක මට දැන් හොඳටම දැනෙනවා විශ්ව.. එයාගෙ ජීවිතේ මට හිමිවෙලා තිබුණ තැන දැන් නැහැ.." නිමන්ත කතාව නවතා දෑස් අගට එක්වුණ කඳුළක් ඇඟිලි තුඩගින් පිස දැමුවේ ය.

"අමන්දි ධාන්‍යයකට සමවැදුණා වගේ හිත එකම තැනක තියාගෙන චිත්‍ර ශිල්පය ඉගෙන ගන්නවා.. ඒක මම දන්නවා නිමන්ත .. ඒක එයාට හොඳයි.. ඒක භාවනාවක්.. ඒ වෙලාවට එයාට එයාගෙ රෝගය ගැනවත් නිනව්වක් නැහැ.. මං නිමන්තට යමක් කියන්නං.. මං අමන්දි ගැන අපේ සුමන හාමුදුරුවො එක්ක කතා කළා.. උන්වහන්සෙ මගේ ඥාතියෙක් වෙනවා.. උන්වහන්සෙ කිව්වෙත් අපි නොහිතන විදිහේ හාස්කම් කරන්න පුලුවන් බලයක් අපේ හිතට තියෙනවා කියලයි.." විශ්වජිත් කීවේ ය.

පසුගිය සති කීපය තුළ අමන්දි පෙන්නුම් කළ ප්‍රගතිය විශාල එකකි. අමන්දි භාවනාවකට සමවැදුනාක් මෙන් සිත්තම් කරනු බලාසිටින විශ්වජිත් ගේ සිත සතුටින් පිරෙයි. බාහිර ලෝකයෙන් වෙන් වී සිත එක්තැන් කරගනිමින් ඇය සමවැදී සිටින වෑතය නොබිඳ ඔහු ඇය නිරීක්ෂණය කරයි. මේ මානසිකත්වය ඇයට සහනයක් ලබා දෙනු ඇතැයි යන දැඩි විශ්වාසයකින් විශ්වජිත් ගේ මනස පිරී තිබුණි.

චිත්‍රශිල්පය නම් වන භාවනාව ඇගේ ගත වෙලා ගනිමින් සිටින රෝගයත් සිත වෙලාගනිමින් සිටි පරාජිත මානසිකත්වයත් යන දෙකම පරාජය කරනු ඇතැයි යන විශ්වාසය විශ්වජිත් ගේ සිතේ ඇති කළේ සුමන හාමුදුරුවන් ය. පසුගිය සතියේ විශ්වජිත් සුමන හාමුදුරුවන් හමුවන්නට ගියේ අමන්දිට හෝ වෙනත් කිසි කෙනෙකුට හෝ නොකියා ය.

සුමන හාමුදුරුවෝ ගිහි කල විශ්වජිත් ගේ ලොකු අප්පච්චි වූහ. ලොකු අප්පච්චි සිය සියලු ධනය සසුනට පූජා කර මහණ දම් පුරන්නට සසුනට ඇතුල් වූයේ විශ්වජිත්ට යාන්තමින් බහ තේරෙන අවධියේ ය. කල් යත්ම සුමන හාමුදුරුවන්ගේ වනගත සෙනසුන ප්‍රසිද්ධ වූයේ එතුමන් මහත් භක්තියකින් රැකගෙන ආ පාරම්පරික වෙදකම නිසාවෙනි.

"ශාරීරික නිධන්ගත ලෙඩ රෝග වලට බෙහෙත් කරන්න මට පුලුවන් පුතා... ඒත් මානසික ශක්තිය කියන එක ගොඩනගන එක මට කරන්න පුලුවන් කාරියක් නෙවෙයි.. ඒකට තමයි භාවනාව තියෙන්නෙ.. භාවනාව කියන දේ නොදැන වුණත් කෙනෙකුට හිත එක්තැන් කරගන්න පුලුවන්.. බෞද්ධ දර්ශනය ගැන මෙලෝ හැඟීමක් නැති බටහිර මිනිස්සුත් සිත එක්තැන් කරගැනීමේ ක්‍රම වල යෙදෙනවා.. වැදගත් වෙන්නෙ ක්‍රමය නෙවෙයි.." සුමන හාමුදුරුවන් කීවේ විසල් බරක් හිසේ දරා ගත් කලෙක මෙන් කල්පනාවෙන් බරවූ සිතින් තමා ඉදිරියේ වූ මිටි අසුනේ වාඩි වී සිටි විශ්වජිත් ගේ බැල්ම මගහැර කවුලුව තුළින් පිටත බලාගත්වනම ය.

"මං කැමතියි ලෙඩා බලන්ඩ.." සුමන හාමුදුරුවන් කී හැටි විශ්වජිත්ට තවමත් මතක ය. ඒ අවසන් වචන හතර ඔහුගේ සිතේ ඇති කළ විශ්වාසය ඔහුට ම අදහාගත නොහැකි තරම් දැඩි එකක් විය.

"සුමන හාමුදුරුවන් ගැන මට ලොකු විශ්වාසයක් තියෙනවා නිමන්ත .."

"අමන්දි මගේ ජීවිතෙන් ඈත් වෙලා ගියාට කමක් නැහැ විශ්ව.." නිමන්ත පහත් හඬින් කීවේ ය. ".. එයා වෙනුවෙන් ඔයාට කරන්න පුලුවන් හැම දෙයක්ම කරන්න.. එයා ජීවත් කරවන්න මට මගේ ජීවිතේ පරිත්‍යාග කරන්න පුලුවන්.. යන හැම වියදමක්ම මං දරන්නම්.. එයාට ජීවිතේ හොයල දෙන්න.. එයාව ජීවත් කරවන්න.."

දියතලය මත පීනා යම සේරු රංචුව දෙස ඇස් රැඳී තිබුණ ද විශ්වජිත් ගේ සිත තිබුණේ බොහෝ ඈත දුරක ය. අමන්දි ගේ කාන්තිමත් දෑසේ රැඳුණ ආකර්ශනය ඒ මොහොතේත් ඔහුට දැනෙමින් තිබුණි.

"අමන්දිට ජීවිතේ හොයල දෙන්න.."

නිමන්ත ගේ ඒ වදන් විශ්වජිත් ගේ දෙසවන රැව් පිළිරැව් දෙමින් තිබුණි.

0000000

වාහනය පදවමින් සිටින විශ්වජිත් දුර කල්පනාවක සිටින්නේ යයි අමන්දිට සිතුණි. මේ මාර්ගයේ නිමන්ත සමගින් බොහෝ වාරයක් ගිය බව අමන්දිට මතක ය. වසරකට වරක් ඔවුන් දෙදෙනා නුවරඑළියට නිවාඩු ගත කරන්නට ගියේ මේ මග ඔස්සේ ය. ඒ ගමන් කෙතරම් මිහිරි වී ද?